# ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
# இலங்கை கடற்படை சமூகம
# SRI LANKA NAVAL ASSOCIATION

ඔබගේ අංකය. Your No.

මාගේ අංකය. My No. SLNA.1

දිනය. Date. 2026.08.17

**Patron** : **Commander of the Navy (ex–officio)**

Hony. President : Rear Admiral Rohan Amarasinghe, RSP, VSV, USP, psc, MNI (Lond), MNESA Centre (USA), (Retd)
Hony. Vice President : Rear Admiral Jayantha Gamage, RSP, USP, ndu, BA (DS), MSc (MS & NSSS), (Retd)
Hony. Secretary : MCPO AS Kumarapperuma, JP (WI), (Retd)
Hony. Treasurer : MCA (RL) AKR Athukorala, USP, JP, (Retd)


**ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සමස්ථ සාමාජිකයින්ගේ අවධානය සඳහා**

**ප්‍රවීණ සුභ සාධක ණය යෝජනා ක්‍රමයට අදාල ප්‍රතිපත්ති හා නව සංශෝධන ඉදිරිපත් කිරීම**

යොමුව : 2026 අගෝස්තු මස 12 වන දිනැති අංක ශ්‍රීලසහප්‍රස/සුසාණය/2026 දරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයේ ගරු සභාපතිගේ ලිපිය.

1. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ‘ප්‍රවීණ සුභසාධක ණය අරමුදල’ සම්බන්ධව නිකුත් කර ඇති පොදු කොන්දේසි සහ අදාළ ණය ඉල්ලුම් පත්‍රය යාකිරීම වශයෙන් ඔබගේ දැන ගැනීම සඳහා මේ සමඟ ඉදිරිපත් කෙරේ.

2. තවද, අදාළ පොදු කොන්දේසි හා ණය ඉල්ලුම් පත්‍රය නාවික හමුදා සංගමයේ නිල වෙබ් අඩවිය වන https://slna.navy.lk හි ‘Our Services’ වෙත පිවිසීමෙන් බාගත කර ගත හැකි අතර, නාවික හමුදා සංගමයට අදාළ සියලුම පෝරම, උපදෙස් හා අනෙකුත් තොරතුරු ද එම වෙබ් අඩවිය මඟින් ලබා ගැනීමේ හැකියාව ඇත.

3. මේ පිළිබඳව සියළු සාමාජිකයින් අතර ප්‍රසිද්ධියක් ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

රියර් අද්මිරාල් ඒආර් අමරසිංහ, ආර්එස්පී, විඑස්වී, යූඑස්පී, පීඑස්සී, (විශ්‍රාමික)
ගරු සභාපති
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය

යාකිරීම : උක්ත යොමු ලිපිය.

# SRI LANKA ARMED FORCES VETERANS' ASSOCIATION

(Renamed Sri Lanka Ex-Servicemens' Association established under Act No 8 of 1976 of the National State Assembly)

CHIEF PATRON
His Excellency the President of the Democratic Socialist Republic of Sri Lanka
VICE PATRONS
Commander of the Sri Lanka Army | Commander of the Sri Lanka Navy | Commander of the Sri Lanka Air Force

PRESIDENT
Lt Col Ajith Siyambalapitiya MSc psc Lsc
+94 779 505 494

HONY SECRETARY GENERAL
Col Sujith Jayasekara RWP RSP MSc psc
+94 773 876 841

HONY TREASURER
Major W Chiltus De Silva
+94 716 893 722

VICE PRESIDENT - ARMY
Brig AH Liyanage

VICE PRESIDENT - NAVY
Capt (S) DA Wijegunawardena USP SSAC MISMM

VICE PRESIDENT – AIR FORCE
Air Vice Marshal LMSK Leelaratne RWP USP


ශ්‍රීලසහප්‍රස/සුසාණය/2026 　　　　　　　　2026 අගොස්තු මස 12 වන දින.

ගරු සභාපතිවරු/ගරු ලේකම්වරු

සියලුම අනුබද්ධිත හා ස්ථාපිත සංගම්වල

**ප්‍රවීණ සුභ සාධක ණය යෝජනා ක්‍රමයට අදාල ප්‍රතිපත්ති හා නව සංශෝධන**

1. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයින්ගේ සංගමය "ප්‍රවීණ සුභසාධක ණය අරමුදල" ලෙස සුභ සාධක ණය අරමුදල ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර, උපරිම වශයෙන් රුපියල් ලක්ෂ දහයක් (රු. 1,000,000.00) ණය මුදලක් අනුබද්ධිත සංගම්වල සාමාජික/ සාමාජිකාවන්ට ලබා ගත හැකිය.

2. මෙම ප්‍රවීණ සුභ සාධක ණය යෝජනා ක්‍රමයට අදාල ප්‍රතිපත්ති නව සංශෝධන හා අදාල ණය ඉල්ලුම් පත්‍රය මෙම ලිපිය සමඟ ඇමුණුම "අ" සහ "ආ" ලෙස ඉදිරිපත් කර ඇත.

3. මෙම ප්‍රවීණ සුභ සාධක ණය අරමුදලට අදාල නව සංශෝධන 2026 අගෝස්තු මස 13 වන දින සිට ක්‍රියාත්මක වේ.

**ලුතිනන් කර්නල් අජිත් සියඹලාපිටිය (විශ්‍රාමික)**
සභාපති- ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය

**සාමාජික සුභසාධක ණය අරමුදල - ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය**

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය වෙතින් සාමාජික සුභසාධණය වෙනුවෙන් ආරම්භ කරන මෙම සාමාජික සුභසාධක ණය අරමුදලට අදාල සංශෝධිත පොදු කොන්දේසි හා පරිපාලන නියෝග පහත සදහන් පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

**පොදු කොන්දේසි**

1 **නාමය**

1.1 ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයේ සාමාජික ප්‍රවීණ සුභසාධක ණය අරමුදල යනුවෙන් ආරම්භ වූ මෙය මින් මතුවට මෙම චක්‍රලේඛයෙහි "අරමුදල" යනුවෙන්ද ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය "ශ්‍රීලසහප්‍රස" යනුවෙන්ද හැඳින්වේ.

2 **ලිපිනය**

2.1 මෙම අරමුදලෙහි ලේකම් කාර්යාලයෙහි ලිපිනය ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය සාමාජික සුභසාධක ණය අරමුදල, අංක:07, "ප්‍රවීණයන්ගේ නිවහන", ආරක්ෂක අමාත්‍යාංශ මාවත, අකුරේගොඩ, බත්තරමුල්ල.

2.2 මෙසේ ලිපිනය වෙනස්වී දින 06 ක් ඇතුලත ඒ බැව් සියලු සාමාජිකයින් වෙත "ශ්‍රීලසහප්‍රස" අනුබද්ධ සංගම් මගින් දැනුම් දිය යුතුය.

3 **පරමාර්ථ**

3.1 අනයෝන්‍යාධාරය මත පදනම් වූ මූල්‍ය ආධාර හා පහසු ගෙවීමේ පදනම මත භාණ්ඩ මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබාදීම තුලින් සාමාජිකයින්ගේ සහ සාමාජික සංගම්වල ආර්ථික සමාජීය හා සුභසාධන අවශ්‍යතාවයන් සපුරාලමින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහල දැමීම.

3.2 ඉදිරියේදි ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීනයන්ගේ සංගමය "ප්‍රවීණ සුභසාධක ණය අරමුදල" ලෙස සුබ සාධක ණය අරමුදලට ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වන අතර උපරිම වශයෙන් රු. 1,000,000.00 ණය මුදලක් අනුබද්ධිත සංගම්වල සාමාජික/සාමාජිකාවන්ට ලබා ගත හැකිය.

4 **බලතල**

"ශ්‍රීලසහප්‍රස" නීති 1992 පනත් අංක 42 මගින් සංශෝධිත, 1976 අංක 08 දරණ පණතේ 2, 3 වන වගන්තිය සමග කියවෙන සේවා මුක්ත හට සංගමයේ නීති අංක 2, 23 සහ 6 වගන්තිය අනුව මෙවැනි අරමුදලක් පවත්වාගෙන යාම සහ ඒ තුලින් මුදල් සහ දේපල ගණුදෙනු කිරීමට බලය හිමිවන්නේය. ඒ අනුව පහත සඳහන් කටයුතු කිරීමට බලය ඇත.

4. 1 අනුබද්ධිත හා සංස්ථාපිත සංගම් වලින්ද මෙම සංගමයේ සාමාජික/සාමාජිකාවන් වෙතින්ද තැන්පතු ලබාගනු ලැබේ. ඒ සඳහා වාර්ෂික පොළිය විධායක කමිටුව තීරණය කර වාර්ෂික මහා සභාවට දැනුම්දීම කරනු ලැබේ. සැමවිටම පවතින බැංකු පොලී අනුපාතයට වඩා අමතර පොලී අනුපාතයක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. (6.2 සඳහන් පරිදි)

4. 2 ඉහත සඳහන් මූල්‍ය කටයුතු සඳහා අදාල වන සියලුම පරිපාලන කටයුතු මෙම ණය අරමුදල මගින් සිදුකරනු ඇත.

4.3 ගෙවීම් පැහැර හැරීම හෝ වංචාකාර කටයුත්තකදී නඩු පැවරීම හා/හෝ නඩු සඳහා පෙනී සිටීම හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම සබැදි අවසාන තීරණය ගැනීම **සුභසාධක ණය අරමුදලේ** කළමණාකරන කමිටුවේ නිර්දේශය මත විධායක කමිටුව විසින් සිදුකල යුතුය.

5. **සාමාජිකත්වය**

5. 1. මෙම අරමුදලේ සුභ සාධක ණය මුදල් ලබාගැනීමට හිමිකම් ලැබෙනුයේ "ශ්‍රීලසහප්‍රස" සාමාජිකත්වය ලබා අවම වශයෙන් වසර 01 ක් ගත වූ අයට පමණි.

5.2. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයෙහි සාමාජිකත්වය දරන කිසිදු සංගමයකට හෝ සාමාජිකයෙකුට මෙවැනිම හෝ මේ හා සමාන වූ තැන්පත් මුදල් ලබාගැනීම් හා ඒ හා සමාන වූ මූල්‍යමය කටයුත්තක් කිරිම සපුරා තහනම් වේ.

5.3 ලබාගන්නා ණය මුදල් නියමිත දිනට විශ්‍රාම වැටුප් මගින් වාරික වශයෙන් අයකරන අතර ණය ලබාදෙනු ලබනුයේ විශ්‍රාම වැටුප් හිමි අයවලුන්ට පමණි. එසේ නොමැතිනම් තැන්පතුවක් සිදුකර ඇති සාමාජිකයෙකුට එම තැන්පත් මුදලින් 90% ක ණය මුදලක් ලබාගත හැකිය.

6. **පොලී අනුපාත**

6. 1 ණය මුදලක් වෙනුවෙන් අයකරනු ලබන පොලිය සහ ආපසු ගෙවීමේ වාරික ගණන කලින් කලට රජයේ බැංකු පොලිය අනුව සුභ සාධක ණය කළමණාකාර කමිටුව විසින් තීරණය කර විධායක කමිටුවේ අනුමැතිය ලබාගත යුතුය. මෙවැනි අවස්ථාවලදී මෙම තීරණය ගැනීමට පෙර ණය ගත් සාමාජිකයන්ගේ පොලී අනුපාතය වෙනස් නොවන අතර, තීරණය ගත්දා සිට ණය ලබා ගන්නා සාමාජිකයන්ට පමනක් මෙය බල පැවැත්වේ.

6.2 2026 වසර බැංකු පොලී අනුපාතයේ සාමාන්‍ය අගය 10% වන අතර අප සංගමය 10.5% පොලී අනුපාතය ලබාදේ. එසේම තැන්පත්කරුගේ මව් සංගමය සදහා 0.25% දිරිදීමනාවක් ලබාදෙනු ලැබේ. මෙම තීරණය ගැනීමේදි සුභසාධක ණය අරමුදලේ කළමණාකරණ කමිටුවේ නිර්දේශයද සැලකිල්ලට ගත යුතුය.

6.3 2026 වසර සදහා ණය මුදල් පොලී අනුපාතිකය 10% කි. පහසු ගෙවීමේ පදනම මත භාණ්ඩ ලබාගැනීම සඳහා පමණක් වසර 5කට අඩු ඕනෑම සාමාජිකයෙක් සඳහා 4% ක අමතර පොලියක් හා වසර 5 කට වැඩි සාමාජිකයින් සඳහා 2% ක අමතර පොලියක් අයකරනු ලැබේ. මෙම පොලී අනුපාත කාලීනව වෙනස් කිරීම සුභසාධක ණය අරමුදලේ කළමණාකරන කමිටුවේ නිර්දේශය මත විධායක කමිටුව විසින් සිදුකල යුතුය.

උදා : වසර 5කට අඩු සාමාජිකයින් සඳහා 14% ක හා වසර 5 කට වැඩි සාමාජිකයින්ට 12% ක වාර්ෂික පොලියක් භාණ්ඩ ලබාගැනීමේදි 2026 වසර සඳහා අය කරනු ලැබේ.

6.4 මෙම නියෝගයන්ට අනුව සඳහා 2026 වර්ෂයේ තැන්පතු සඳහා 10.5% වාර්ෂික පොලියක් ලබාදෙන අතර. එසේම අනුබද්ධිත සංගම් තැන්පත් කරන මුදල් වලට 10.75% පොලියක් ලබාදෙනු ලැබේ. එසේම මෙම පොලී ප්‍රතිශතය බැංකු පොලිය වෙනස් විම මත හා වාර්ෂිකව සුභසාධක ණය අරමුදලේ කළමණාකරන කමිටුවේ නිර්දේශය මත විධායක කමිටුවේ තීරණය මත වෙනස්විය හැක.

6.5 සාමාජිකයින්ගේ තැන්පතු සඳහා සාමාජිකයාගේ මව් සංගමයට අමතර 0.25% ක පොලියක් ලබාදෙනු ලැබේ.

6.6 භාණ්ඩ ලබා ගැනිමේදී වසර 5ට වඩා අඩු සාමාජිකත්වයක් ඇති ඕනෑම සාමාජියෙකුට 14% පොලී අනුපාතය මත ණය ලබාගත හැකිය.

6.7 එසේම ආපදාවලට මුහුනදීම වැනි සානුකම්පිත හේතුන් මත ණය මුදල් ඉල්ලුම් කරනු ලබන වසර 5ට වැඩි සාමාජිකත්වය හිමි අය සඳහා වන පොලී ප්‍රතිශතය සහ ණය දෙනු ලබන ක්‍රමවේදය සුභසාධක ණය අරමුදලේ කළමණාකරන කමිටුවේ නිර්දේශය මත විධායක සභාව විසින් තීරණය කල යුතුය.

උදා:- අනපේක්ෂිත ස්වභාවික විපතකට මුහුණදුන් සාමාජිකයන් (විපත පිළිබඳව විස්තර ඇතුලත් ග්‍රාම නිළධාරි වාර්ථාවක් ප්‍රදේශිය ලේකම් විසින් සහතික කර ඉදිරිපත් කල යුතුයි)

6.8 මාසික පොලිය ලබාගන්නා තැන්පත්කරුවන්ට 9% පොලී අනුපාතයක් ලබාදෙනු ලැබේ.

6.9 නියමිත කාලයට පෙර තැන්පත් කල මුදල් ලබාගන්නා විට අඩු පොලී අනුපාතයක් තැන්පත් කල මුදල සඳහා ගෙවනු ලැබේ. වසරක 1ක කාලයක් සඳහා තැන්පතු ලබාදුන් සාමාජිකයකු හෝ අනුබද්ධ සංගමයක් මාස 01 සිට මාස 05 දක්වා තැන්පතු ආපසු ලබාගත හොත් 4%ක පොලී අනුපාතයක්ද මාස 06 සිට මාස 11 වන තෙක් මුදල් ආපසු ලබා ගත හොත් 6% පොලී අනුපාතයක්ද ගෙවනු ලැබේ.

6.10 විශේෂ ඉල්ලීම් මත අනුබද්ධිත සංගම් වලට ණය ලබා දීමේදී පොලී අනුපාතය **සුභසාධක ණය අරමුදලේ** කළමණාකරන කමිටුවේ නිර්දේශය මත විධායක සභාව විසින් තීරණය කරනු ඇත.

7. **පරිපාලන නියෝග**

7. 1 අනුබද්ධිත සංගමය හරහා ශ්‍රිලසහප්‍රස සාමාජිකත්වය ලබා අවම වශයෙන් වසරක් ඉක්මවා ඇති සියළුම සාමාජිකයින්ට ණය මුදල් ඉල්ලුම් කිරිමේ හැකියාව ඇත.

7.2 පහසු ගෙවීමේ පදනම මත භාණ්ඩ ලබාගන්නා සාමාජිකයින්ට සාමාජිකත්ව කාලය බල නොපානු ඇත.

7. 3 "ශ්‍රිලසහප්‍රස"හි සාමාජිකත්වය අහිමි වන අයෙකුට මෙම අරමුදලේ මුල්‍යාමය වගකීම් වලින් නිදහස් වන තෙක් සුභසාධක ණය අරමුදලේ කළමණාකරන කමිටුවේ නිර්දේශය මත විධායක කමිටුවේ අභිමතය පරිදි ඉදිරියට සාමාජිකත්වය පවත්වා ගෙන යනු ලබයි. එසේ වුවද මුල්‍යාමය වගකීමෙන් නිදහස් වූ පසු සාමාජිකත්වය අහිමි කරනු ලැබේ.

7. 4 ණය අයදුම්පත ප්‍රතික්ෂෙප කරන අයෙකුට ඒ සඳහා මුල් වූ හේතු ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.

8. <u>සුභ සාධක **ණය අරමුදලේ** කළමණාකරණ කමිටුව</u>

**8.1 සුබ සාධක ණය සහ පහසු ගෙවීමේ භාණ්ඩ ණය කමිටුව මෙම නියෝග ක්‍රියාත්මක කල යුතු අතර, විධායක කමිටුව සඳහා වගකිව යුතුවේ.**

8.2 ණය වාරික මුදල් අයකිරීම හා නොගෙවූ වාරික මුදල් නියමිත දඩ මුදල්ද සමග අයකර ගැනීම හා අධීක්ෂණය කිරීම.

8.3 මෙම නියෝගයන්ට අනුව ණය අරමුදල පරිපාලණය සම්බන්ධව නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි ණය මුදල් නිකුත් කිරීම, වාර්ෂික පොලිය සහ ලාභාංශ පිළිබද විධායක කමිටුවට නිර්දේශ ඉදිරිපත් කිරීම, ණය සහ පොලිය අයකර ගැනීම, අවශ්‍යය වූ විට ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම වැනි කටයුතු අධීක්ෂණය කිරීම හා ඒ සම්බන්ධව විධායක කමිටුව දැනුවත් කිරීම.

8.4 ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව විධායක කමිටුවේ අනුමැතිය මත නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීම.

9 <u>**දිගු කාලීන ණය**</u>

9.1 සාමාජික ඇප මත ණය

9.1.1 එක් පුද්ගලයෙකුට ලබා ගත හැකි අවම සහ උපරිම ණය සීමාව : රු: පනස් දහසේ (50,000.00) සිට රු: මිලියන එකක් (1,000,000.00)දක්වා පමණි.

9.1.2 පහත සදහන් කරුණු සදහා ණය ඉල්ලුම් කල හැකිය.

අ. නිවාස ඉදිකිරීම
ආ. ඉඩම් මිළදී ගැනීම
ඇ. නිවාස අලුත්වැඩියාව හෝ නවීකරණය කිරීම
ඈ. අධ්‍යාපන කටයුතු
ඉ. කෘෂිකාර්මික කටයුතු
ඊ. ආපදා සහ පවුලේ අවශ්‍යතා
උ. ගෘහ භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ මිළට ගැනීම
ඌ. ව්‍යාපාරික කටයුතු
එ. යාන්ත්‍රික වාහන මිලදි ගැනීම

10. <u>**ණයකරු සදහා කොන්දේසි**</u>

10.1 සෑම ණයකරුවෙකුටම ණය මුදල් ලබාදෙනු ලබන්නේ මෙම ව්‍යවස්ථාවේ කොන්දේසි සහ නියෝග වලට අනුකූලව පමණි.

10.2 සෑම සාමාජිකයෙකුම ණය ඉල්ලුම් කිරිමේදි එම සාමාජිකයා විසින් ඉදිරිපත් කරනු ලබන ඇපකරුවන්ගේ අයදුම්පත් අදාල අනුබද්ධිත සංගමයේ සභාපති/ලේකම් විසින් ඔවුන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කල යුතුය.

10.3 ණය කරුවා මියගිය හොත් හෝ කිසියම් හේතුවක් මත එම ණය මුදල ණයකරු විසින් ගෙවීමට අපොහොසත් වුවහොත් කාලත්‍රයා සහ ඉදිරිපත් කර ඇති ඇපකරුවන්හට අදාල ණය මුදල ඇපකරුවන්ගේ විශ්‍රාම වැටුපෙන් හෝ වෙනත් ආදයම් මාර්ගයකින් ගෙවීමට කැමැත්ත පලකල දිවුරුම් ප්‍රකාශයක් නිතිඥවරයෙකු, දිවිරුම් කොමසාරිස්වරයෙකු හෝ සාමදාන විනිශ්චකරුවෙකු මගින් සහතික කොට රුපියල් පනහක (50) මුද්දරයක් මත අත්සන් කර ඉදිරිපත් කල යුතුය.

10.4 අඩු කරගතහැකි උපරිම වාරිකය විශ්‍රාම වැටුපෙන් 60% ක් පමණි. ණයකරුවාට ලබාගත හැකි උපරිම ණය මුදල මෙම ආයතනයේ ගණකාධිවරයා විසින් පරික්ෂා කර නිර්දේශ කිරීමෙන් පසු අදාල ණය මුදල ලබාදෙනු ලැබේ.

10.5 ණය මුදල් ආපසු ගෙවීමේ උපරිම කාල නියමයන්

| | ණය මුදල | උපරිම මාසික වාරික |
|---|---|---|
| අ. | රු: පනස් දහස (50,000.00) - රු: ලක්ෂ එක (100,000.00) | දක්වා වාරික 12 |
| ආ. | රු: ලක්ෂ එකේ(100,000.00) - රු: ලක්ෂ දෙක(200,000.00) | දක්වා වාරික 24 |
| ඇ. | රු: ලක්ෂ දෙක(200,000.00) - රු: ලක්ෂ හතර(400,000.00) | දක්වා වාරික 36 |
| ඈ. | රු: ලක්ෂ හතර(400,000.00) - රු: ලක්ෂ හය (600,000.00) | දක්වා වාරික 48 |
| ඉ. | රු: ලක්ෂ හය (600,000.00) - රු:මිලියන එක1,000,000.00 | දක්වා වාරික 60 |

10.6 ණය මුදලක් අයදුම් කරන්නා විශ්‍රාමියෙකු විය යුතු අතර, තම විශ්‍රාම වැටුපෙන් ණය වාරිකය අයකර ගැනීමට ඔහුගේ/ඇයගේ කැමැත්ත ප්‍රකාශ කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ශ්‍රීලසහප්‍රස වෙත ලබාදිය යුතුය. එවිට එම වාරිකය ඔහුගේ/ඇයගේ මාසික විශ්‍රාම වැටුපෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා අයකර ගැනීමට කටයුතු සම්පාදණය කරනු ලැබේ. ණය ගෙවා නිමවන තෙක් කිසිදු ආකාරයකින් මෙම කැමැත්ත අවලංගු කල නොහැක.

10.7 නිකුත් කරනු ලබන ණය මුදලට අදාලව 4% මුදලක්, ලබාගන්නා ණය මුදල අනුව පළමු/දෙවන වාරිකය වශයෙන් අයකර ගන්නා අතර එය ණය අරමුදලේ සංචිත ආරක්ෂිත ආවරණයක් ලෙස ණය අරමුදලේ තැන්පත් කරනු ලැබේ. එම මුදල නැවත ගෙවනු නොලබන ආවරණයකි.

10.8 සාමාජිකයකු ණය මුදලක් හෝ පහසු ගෙවීමේ පදනම මත භාණ්ඩ මිලදී ගැනීම සඳහා ණය මුදලක් අයදුම් කරන අවස්ථාවේදීම හවුල් ණයකරු වශයෙන් තම කලාත්‍රයා හෝ කලාත්‍රයකු නොමැති සාමාජිකයකු (10.9 දක්වා ඇති පරිදි) සඳහා ලඟම ඥාතියකු අත්සන් කල යුතුය.

10.9 හවුල් ණයකරු වශයෙන් තම කලාත්‍රයා නොමැති අවස්ථාවකදී අදායමක් ලබන ලඟම ඥාතියකු අත්සන් කල යුතුයි. (මව/පියා/ දරුවකු/ සහෝදරයකු හෝ සහෝදරියකු)

11. <u>ඇපකරුවන් සඳහා කොන්දේසි</u>

11. 1 සෑම ඇපකරුවෙකුම "ශ්‍රීලසහප්‍රස" සාමාජිකයෙකු විය යුතු අතර, මුදල් ණය සහ පහසු ගෙවීමේ පදනම මත භාණ්ඩ මිලදී ගැනීමේ ණය සඳහා ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් වන අයගේ සාමාජිකත්වය අවම වශයෙන් වසරක් සපුරා තිබිය යුතුය.

11. 2 ණය දෙන සෑම අවස්ථාවකදීම වෙනත් සාමාජිකයින් දෙදෙනෙකු ඇප කරුවන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය. ණයකරු සහ ඇපකරුවන් යන තිදෙනාම විශ්‍රාම වැටුප් හිමිකම් ලාභීන් විය යුතුය.

11. 3 ඇපකරුවෙකු මිය ගිය අවස්ථාවක ණය ලබා ගන්නා විසින් ඒ වෙනුවට වෙනත් ඇපකරුවෙකු ඉදිරිපත් කර ණයට අදාල ලිපි ලේඛණ ඔහු ලවා අත්සන් කර දිවිරුම් කොමසාරිස්වරයෙකු/සාමදාන විනිශ්චකරුවෙකු සහතික කොට ඉදිරිපත් කිරීමට ණයකරු කැමැත්ත ප්‍රකාශ කර ලිපියක් ඉදිරිපත් කල යුතුයි.

11. 4 ණය පිළිබඳ අදාල කොන්දේසි සහ නියෝග වලට අවනත වන බවට ණය ලබාගන්නා සහ ඇපකරුවන් දෙදෙනා ගිවිසුමකට අත්සන් තැබීමෙන් සහතික විය යුතුය.

11. 5 එක් ණයක් ලබා ගෙන ඇති විටක ණය සීමාවේ ඉඩකඩ තිබුනද ණය මුදල සම්පූර්ණයෙන් ගෙවන තෙක් නැවත ණයක් ඉල්ලුම් කල නොහැක.

11. 6 එක් සාමාජිකයෙකුට ඇපවිය හැක්කේ සාමාජිකයින් දෙදෙනෙකුගේ ණය සඳහා පමණි.

11. 7 ණයකරු හෝ ඇපකරුවන් ණය මුදල ගෙවා අවසන් වන කාලසීමාව තුල ඇපකරුවන්ගේ හා ණය කරුගේ වයස අවුරුදු 75 ට අඩුවිය යුතුය.

11. 8 වයස් සීමාව 75 – 78 දක්වා වන සාමාජිකයින්ට රු. ලක්ෂ 2 ක ණය මුදලක් හා 79 – 80 වන සාමාජිකයින්ට රු. ලක්ෂ 1 ක ණය මුදලක් ලබා ගැනීමට හැක.

11. 9 ණයකරු හා ඇපකරුවා ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශය සහතික කිරිම ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයේ නිළධාරී මණ්ඩලයේ සේවය නොකරන දිව්රුම් කොමසාරිස්/සමාදාන විනිශ්චයකරුවෙකු විසින් සහතික කල යුතුය.

11.10 ණයකරුගේ හදිසි අභාවයකදී හෝ සාදාකාලික අබාධිත තත්වයකදී හා කලාත්‍රයාටද ණය ගෙවීමට නොහැකි වන අවස්ථාවකදී ණයකරු විසින් ගෙවීමට ඇති ණය මුදලින් 25%ක් හා එයට නියමිත පොලිය ඇපකරුගේ විශ්‍රාම වැටුපෙන් ගෙවිය යුතුය. මෙවැනි අවස්ථාවකදී ගෙවීමට ඇති ණය මුදලින් 50% ක් ශ්‍රීලසහප්‍රස ඇති ආරක්ෂණ සංචිතයෙන්ද පළමු ඇපකරු 25%ක්ද දෙවන ඇපකරු 25%ක්ද ගෙවිය යුතුය.

11.11 සෑම ඇපකරුවකුම ණයකරු අයත් එම හමුදාවෙන්ම විය යුතුය. උදා:- ණය ලබගන්නා යුධ හමුදා සංගමයක සාමාජියකු වන අවස්ථාවේදී ඇපකරුවන් දෙදෙනාද යුද හමුදා සංගමයක සාමාජිකයින්ම විය යුතුය.

12. **ණය පහසුකම් සඳහා පොදු කොන්දේසි**

12.1 ණය ලබාගත හැක්කේ මෙම සංගමයේ සාමාජිකත්වය ලබාගත් සාමාජිකයින්ට පමණි. ණය සඳහා සුදුසුකම් සපුරාලන සාමාජිකයින් දෙදෙනෙකු ඇපවිය යුතු අතර ණය ඉල්ලුම් කරන සාමාජිකයාගේ පූර්ණ සාමාජිකත්වය සහ විනයගරුක සාමාජිකයෙකු බවට ඔහුගේ/ඇයගේ සංගමය විසින් සහතික කල යුතුය.

12.2 ණය මුදල්, මෝටර් බයිසිකල්, විදුලි උපකරණ හෝ වෙනත් ගෘහ උපකරණ මිළදී ගැනීම සඳහා සාමාජිකයින් තිදෙනෙකු හෝ කණ්ඩායමක් ලෙස එකිනෙකාට ඇපකරුවන් වශයෙන් අත්සන් කර ණය පහසුකම් ලබාගත නොහැකිය.

12.3 කලින් ලබාගත් ණය මුදලක ණය වාරික හිගව ඇත්නම් හෝ ඉල්ලුම්කරු ඇපවූ ණය මුදලක ණය වාරික හිගව ඇත්නම් එම ණය වාරික යාවත්කාලීන කරන තුරු කිසිඳු සාමාජිකයකු ණය කරුවෙකු ලෙස හෝ ඇපකරුවෙකු ලෙස භාරගනු නොලැබේ.

12.4 ණය ආපසු ගෙවීමට නියමිත කාලසීමාව තම වයසට එකතු කල විට අවුරුදු 75 නොඉක්මවිය යුතුය.

12.5 සුවිශේෂ වු සානුකම්පිත හේතූන් මත කළමණාකරණ කමිටුවේ අණුමැතියට යටත්ව ණය ගෙවීමට නියමිත කාලසීමාව තුලදී වයස් සීමාව අවුරුදු 70 ඉක්මවනු ලබන අයදුම්කරුවන්ගේ ණය අයදුම්පත් සළකා බලනු ලබන්නේ අවම වශයෙන් ඔහු විසින් ඉදිරිපත් කර ඇති ඇපකරුවන් එම වයස් සීමාවට ඇතුලත් වන්නේ නම් පමණි.

12.6 ඉල්ලුම් කරනු ලබන ණය මුදල සඳහා ඇපකරුවන් දෙදෙනෙකුද ඉදිරිපත් කල යුතු අතර ණයකරු සහ ඇපකරුවන් දෙදෙනාම විශ්‍රාම වැටුප් හිමිකම්ලාභින් විය යුතුය. ණය මුදල් ලබා ගැනීමේදී ණය ඉල්ලුම් කරුවා සහ ඇපකරුවන් දෙදෙනා වසරක සමාජිකත්ව කාලයක් අවම වශයෙන් සපුරා තිබිය යුතුය.

12.7 අනුබද්ධිත සංගම්වලට ඔවුන්ගේ විධායක සභාවේ අනුමැතිය මත උපරිම රු මිලියන 3ක් දක්වා ලබාගැනීමට හැකියාවක් ඇත.**එසේ ඉල්ලුම් කරන අවස්තාවලදි එම අනුබද්ධිත සංගමයට එම මුදල නිරවුල් කිරිමට මුල්‍යමය හැකියාවක් ඇත්දැයි සොයාබලා ශ්‍රිලසසේප්‍රස විධායක කමිටුවේ පූර්ණ අනුමැතිය ලබාගත යුතුය.**

12.8 පළමු වරට ණය මුදලක් මෙම ප්‍රවීණ සුබ සාධක ණය අරමුදලින් ඉල්ලුම් කරන සාමාජිකයින්ට ප්‍රමුඛතාවය ලබාදෙනු ලබයි.

12.9 මීට ප්‍රථම ණය මුදල් ලබාගත් සාමාජිකයින්ට ඔවුන්ගේ ලබාගත් ණය සහ පොලිය සම්පූර්ණයෙන් ගෙවූ පසු ඉතිරි මුදල ණයක් ලෙස ලබාගත හැකිය.

12.10 **ලක්ෂ 5ක් හෝ ඊට වඩා අඩු මුදලක් ලබාගෙන ඇති සාමාජිකයින්ට අරමුදලේ ඇති සංචිත ප්‍රමාණය අනුව හා පොරොත්තු ලේඛණයේ අනුපිලිවෙලට රුපියල් මිලියණයක් දක්වා ලබාදීමට සලකා බලනු ලැබේ.**

12.11 ඕනෑම භාණ්ඩයක් මිලදී ගැනීමේදී මෙම සංගමය මුල්‍ය ණය පහසුකම් පමනක් සපයන අතර මිලදී ගත් භාණ්ඩය සබැදිව වගකීමක් දරනු නොලැබේ. එම භාණ්ඩ නිර්දේශ කිරිමක්ද කරනු නොලැබේ. භාණ්ඩය මිලදී ගැනීම හා පසු සේවාවන් මිලදී ගන්නා අයගේ කැමැත්ත හා සැපයුම්කරුගේ එකඟතාවය මත සිදුකරනු ලැබේ.

12.12 සැපයුම්කරුවෙකු වෙත ඉදුරාම මුදල් යොමු කිරිමට ණය ලබාගන්නා සාමාජිකයා කැමැත්ත ප්‍රකාශ කර ලිපියක් ලබාදිය යුතුය.

12.13 නව සාමාජිකයකු භාන්ඩ සඳහා ණය ඉල්ලුම් කරන්නේ නම් ඔහු හෝ ඇය ප්‍රථමයෙන් අනුබද්ධිත සංගමයේ සහ මෙම සංගමයේ සාමාජිකත්වය ලබාගැනීම සහ මෙම ලියකියවිලි සම්පූර්ණ කිරිම සහ සාමාජික මුදල් ගෙවීම අනිවාර්ය වේ.

12.14 භාණ්ඩ මිලදි ගැනීමකින් තොරව ණය මුදල් ලබා ගන්නේ නම් පහත සඳහන් පරිදි ණය මුදල් ලබා ගත හැක.

| අංකය | සාමාජිකත්වය | හිමි ණය මුදල | පොලී ප්‍රතිශතය |
|---|---|---|---|
| 01 | වසර 1කට වඩා අඩු | හිමිකම් නොමැත | - |
| 02 | වසර 1සිට 2 දක්වා | රු. 100,000.00 | 10.0% |
| 03 | වසර 2සිට 3 දක්වා | රු. 200,000.00 | 10.0% |
| 04 | වසර 3සිට 4 දක්වා | රු. 300,000.00 | 10.0% |
| 05 | වසර 4සිට 5 දක්වා | රු. 500,000.00 | 10.0% |
| 06 | වසර 5ට වැඩි | රු. 1000,000.00 | 10.0% |

12.15 එසේම ආදාළ ආයෝජන මුදල් ප්‍රමානය සඳහා සියළුම තැන්පත්කරුවන්ට වලංගු සහතික පත්‍රයක් ලබාදෙනු ලැබේ.

12.16 ණය අරමුදලෙහි මුදල් අතිරික්තයක් ඇතිවූ විට තැන්පත් ලබාගැනීම සීමා කිරීමට සුභ සාධක ණය කමිටුවේ නිර්දේශය මත විධායක කමිටුවට තීරණය කල හැකිය.

12.17 සෑම ණය මුදලක් සඳහාම රු. 500.00 පරිපාලන ගාස්තුවක් ණය ලබාගන්නා අවස්ථාවේදි මුදලින් ගෙවා රිසිට් පතක් ලබාගත යුතුය.

## 13. <u>**මුදල් තැන්පත්කරුවන් සඳහා කොන්දේසි**</u>

13.1 මුදල් තැන්පත්කරුවන් සඳහා 6.4 වගන්තියේ සඳහන් පරිදි වාර්ෂික පොලියක් 2026 වර්ෂය සඳහා ලබාදෙනු ඇත. මාස හයකට වරක් සෑම ජනවාරි සහ ජුලි මාස වලදී පොලී අනුපාතය බැංකු පොලී අනුපාතයට අනුව විධායක සභාව සමාලෝචණය කරනු ලැබේ.

13.2 මුදල් තැන්පත්කරුවන් හදිසි අවශ්‍යතාවයකට රුපියල් **ලක්ෂ 2 හා රුපියල් ලක්ෂ 5 අතර මුදලක් ආපසු ලබාගන්නේ නම් වැඩ කරන දින 7 කට පෙර දැනුම් දිමකින් හා රුපියල් ලක්ෂ 5 හා රුපියල් ලක්ෂ 10 අතර මුදලක් ආපසු ලබාගන්නේ නම් වැඩ කරන දින 14කට පෙර දැනුම් දිමකින් හා රුපියල් ලක්ෂ 10 ට වැඩි මුදලක් ආපසු ලබාගන්නේ නම් දින 20 කට පෙර පූර්ව දැනුම් දීමක් කල යුතුය. රුපියල් ලක්ෂ දෙකකට අඩු මුදලක් හදිසි අවශ්‍යතාවකදී ආපසු ලබාගන්නේ නම් දින 1 ක පූර්ව දැනුම් දීමක් කල යුතුය.**

13.3 තැන්පත් කල හැකි අවම මුදල රු: 25,000.00 අතර උපරිම මුදල සීමාවක් නැත

13.4 නියමිත කාලයට පෙර තැන්පත් කල මුදල් ලබාගන්නා විට 6.9 වගන්තියේ සඳහන් පරිදි අඩු පොලී අනුපාතයක් ගෙවනු ලැබේ.

13.5 මුදල් තැන්පත්කරු මියගිය විට ලගම ඥාතියාට හෝ නම් කරන ලද භාරකාරයාට තැන්පත් කල මුදල සහ අදාල පොලිය ලබා දෙනු ලැබේ.

13.6 තැන්පත්කරුවන් ආයෝජණය කරන මුදල ණය අරමුදලේ පමණක් ආයෝජණය කරන අතර වෙනත් ව්‍යාපෘතිවල ආයෝජණය නොකෙරේ. මේ මගින් තැන්පත්කරුවන්හට ඔවුන්ගේ තැන්පත් මුදල් වලට වඩා ආරක්ෂිතභාවයක් ලබාදෙන අතර අවදානම අවම කෙරෙයි.

## 14. **සාමාජිකයා ණය මුදලක් ලබාගෙන එය පියවීමට පෙර මියගිය හොත් ඒ සඳහා කොන්දේසී.**

අ. සාමාජිකයාගේ හිඟණය මුදල ඔහුගේ /ඇයගේ කලත්‍රයාගේ වැන්දඹු හා අනත්දරු වැටුප මගින් ගෙවීමට හෝ වෙනත් ආකාරයෙන් පියවීමට කැමැත්ත ප්‍රකාශ කර දිව්රුම් කොමසාරිස්/ **සාමාදාන විනිශ්චකරුවෙකු සහතික කල දිව්රුම් ප්‍රකාශයක් හෝ පොරොන්දු පත්‍රයක් ණය අයදුම්පත සමඟ ඉදිරිපත් කල** යුතුය.

ආ. ඉහත (අ) කොන්දේසිය සපුරා ගත නොහැකි අවස්ථාවලදි පමණක් 25% බැගින් ඇපකරුවන් දෙදෙනාගේ **විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර දිව්රුම් කොමසාරිස් / සාමදාන විනිශ්චකරුවෙකුගෙන් සහතික කර දිවුරුම් ප්‍රකාශයක් ලබාගත යුතුය.** සුභ සාධක ණය කළමණාකරන කමිටුවේ නිර්දේශ මත හා විධායක කමිටුවේ අනුමැතිය මත ඉතිරි හිඟ ණය මුදලෙන් 50% සංචිත මුදලෙන්ද ලබා ගත යුතුය.

**ඇ. සාමාජිකයා කලාත්‍රයා සහ ඇපකරුවන්ගේ මරණයකදි ඉහත (අ) සහ (ආ) කොන්දේසි පරිදි අයකර ගත නොහැකි අවස්ථාවකදි සුභ සාධක ණය කළමණාකාර කමිටුවේ නිර්දේශ මත විධායක කමිටුවේ බහුතර කැමැත්ත පරිදි සුදුසු තීරණයක් ගත යුතුය.**

15. මෙම ප්‍රවීණ සුභසාධක ණය අරමුදලට අදාල නව කොන්දේසි 2026 අගෝස්තු මස 15 වන දින සිට ක්‍රියාත්මක වේ.

16. භාණ්ඩ ලෙස වාහන/ යතුරු පැදි මෙම සංගමයෙන් ලබාදෙන ණය මුදලක් හරහා ලබාගන්නා විට එම වාහනයේ/ යතුරු පැදියේ ලියාපදිංචි සහතිකය ණය මුදලේ ආරක්ෂාව සඳහා රඳවා තබාගන්නා අතර මේ සම්බන්ධව ණයකරුගේ කැමැත්ත ප්‍රකාශ කර ලිපියක් ලබාගත යුතු අතර අවශ්‍ය නම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් මෙම ආයතනයෙන් සහතික කර ලබාගත හැක.

17. මෙම ආයතනයෙන් සුභසාධක පදනම මත ලබාදෙන ණය මුදල් උපරිම වාරික 60ක් (ලබා ගන්නා ණය මුදල අනුව වාරික ගනන තීරණය කරනු ලබයි) වශයෙන් විශ්‍රාම වැටුපෙන් අයකිරීම විශ්‍රාමික සාමාජිකයගේ කැමැත්ත මත සිදුකරන අතර එම වාරික මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසාන වන තෙක් විශ්‍රාම වැටුපෙන් ගෙවීමට ණයකරුවා එකඟතාවය පලකර දිවුරුම් ප්‍රකාශයක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජෙනරාල්වරයා වෙත ලබා දිය යුතුය.

18. අප සංගමය සමග ආයෝජණය කර ඇති අනුබද්ධිත සංගම්/සාමාජිකයින්ට තැන්පත් කර ඇති මුදලින් 90%ක උපරිමයකට යටත්ව සංගමයේ එවකට පවතින පොලී අනුපාතයට වඩා 2% අඩුවෙන් ණය ලබාගත හැකි අතර ආයෝජණය කල මුදලට වඩා වැඩි මුදලක් කෙටි කාලයකදී ව්‍යපෘතියක් සඳහා බලාපොරුත්තු වන්නේ නම් ව්‍යාපෘති වාර්ථාවක්ද එම අනුබද්ධිත සංගමයේ විධායක කමිටුවේ අනුමැතිය හා මව් සංගමයේ විධායක කමිටුවේ අනුමැතියද ලබාගත යුතුය.

19. අනුබද්ධිත සංගම් වලින් ණය සඳහා ඉල්ලීම් ලද පසු එය සුභ සාධක ණය කළමණකරන කමිටුව අධ්‍යණය කර විධායක කමිටුවේ අනුමැතිය ලබාගත යුතුය.

20. අනුබද්ධිත සංගම් සඳහා ලබාදෙන ණය මුදල වාර්ෂිකව හෝ මාසිකව වාරික හා පොලිය සමඟ ගෙවිය හැකි අතර කෙටිකාලින ව්‍යාපති ණය මාස 06ක් තුල සම්පූර්ණ කර ගෙවා නිම කල යුතුවේ.

21. යම් ණයකරුවකු ණය වාරික විශ්‍රාම වැටුපෙන් ගෙවීම නැවැත්වීමට අවශ්‍ය නම් ඉතිරි ණය මුදල හා පොලිය සම්පූර්ණයෙන් ගෙවිය යුතුය.

22. ණයකරුවකුගේ මරණයකදී පොලි මුදල නොමැතිව හිඟ ණය මුදල පමනක් අයකරනු ලැබේ. හිඟ ණය මුදල අයකර ගැනිමේදී කලාත්‍රයාගේ මාස 03ක් ඇතුලත හා එසේ නොමැතිව ඇපකරුවන්ගෙන් ණය මුදල අයකර ගන්නා අවස්ථාවලදි 04 වන මාසයේ සිට ණය මුදල අයකර ගැනීම සිදුකල යුතුය. මෙම ක්‍රමවේදය වෙනස් ව න්නේ නම් සුභ සාධක ණය කළමණාකරනකමිටුවේ නිර්දේශය මත විධායක කමිටුවේ අනුමැතිය මත ක්‍රියාමාර්ග ගත යුතුය.

**<u>ණය ඉල්ලුම් පත්‍රය</u>**

**<u>පහසු ගෙවීමේ පදනම මත මුදල් හා භාණ්ඩ මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබාදීම</u>**

**<u>සාමාජික සුභසාධක ණය අරමුදල -ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය</u>**

1. **මුලකුරු සමග නම** ..........................................................................................................

2. **සම්පූර්ණ නම** ........................................... ...................................................................

3. **ලිපිනය (සනාථ කිරිම සඳහා විදුලි/ජල/දුරකථන බිල් පතක සනාථ කරන ලද පිටපතක් ඇමිණිය යුතුයි)** ...........................................................................................................................

4. **උපන් දිනය** .................... 4.1 **ණය ඉල්ලුම් කරන දිනට වයස-අවු** .......... **මාස-**............**දින-**...........

**5.** විශ්‍රාම ගිය දිනය ................... ශ්‍රීලසහප්‍රස සාමාජිකත්වය ලබාගත් දිනය........................................

6. **සාමාජික අංකය**............................... 6. **අනුබද්ධිත සංගමය**................................................

7. **ජාතික හැඳුනුම්පත් අංකය**............................. **ශ්‍රීලසහප්‍රස හැඳුනුම්පත් අංකය**....................................
**(පිටපත් ඇමිණිය යුතුය)** **(පිටපත් ඇමිණිය යුතුය)**

8. **දුරකථන අංක (අ). ස්ථාවර**................................... **ජංගම** ........................................................

**9.** දැනට කරන රැකියාව..................................................................................................................

**10.** වැටුප .................................... **11.**වෙනත් ආදායම් මාර්ග...............................................................

12. විශ්‍රාම වැටුප්ලාභී අයෙක්ද ............................... විශ්‍රාම වැටුප් අංකය...........................................
(විශ්‍රාමික හැඳුනුම්පතහි පිටපතක් ඇමිණිය යුතුය)

13. **ඉල්ලුම් කරන ණය මුදල** .............................**ණය අවශ්‍යා කාරණය** ................................................

14. **මාසික ආදායම රු**....................................... 15. **මාසයකට ගෙවීමට හැකි ණය වාරිකය** ................................

16. ඇපකරුවන් පිලිබඳ විස්තර

| **නම** | **සාමාජික අංකය** | **සංගමය** |
| --- | --- | --- |
| ................................................ | ........................ | ................................................ |
| ................................................ | ........................ | ................................................ |

**17.** ලබාගනු ලබන ණය මුදලින් 4% ක මුදලක් ආරක්ෂිත ඇපයක් වශයෙන්, ලබාගනු ලබන ණය මුදල අනුව වාරික එකකින් හෝ දෙකකින් විශ්‍රාම වැටුපෙන් අයකර ගන්නා බවද මා දැනුවත් බවත් සහතික කරමි.

18. මා විසින් මෙහි දක්වා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය බවත් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයේ 2026 **ජුනි මස 16 දින නිකුත් කරන ලද අංක ශ්‍රීලසහප්‍රස/සුසාණය/2026** සුභ සාධක ණය අරමුදලේ පොදු කොන්දේසි හා පරිපාලන නියෝග ලිපියට එකග වන අතර ඒ අනුව යම් අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බවට සනාථ වුවහොත් ගෙවා ඇති ණය මුදල් හා සියලු පොලියද එකවර වහාම ගෙවීමට හා සාමාජිකත්වය අහිමි කරනු ලැබිමකට යටත් වෙන බවට සහතික වෙමි. තවද ලබාගත් ණය මුදල මාගේ විශ්‍රාම වැටුපෙන් වාරික ..........කින් ගෙවීමට මාගේ පූර්ණ අනුමැතිය ප්‍රකාශ කරන අතර, ශ්‍රීලසහප්‍රස අනුමැතියක් නොමැතිව මාගේ විශ්‍රාම වැටුපෙන් අඩු කරන මුදල්, ණය ගෙවීම නිමවන තෙක් කිසිදු ආකාරයකින් ප්‍රකාශ කල කැමැත්ත අවලංගු නොකරන බව ද ප්‍රකාශ අතර, **තවද ඇපකරුවකු මියගිය අවස්ථාවක ඒ වෙනුවට වෙනත් ඇපකරුවකු ඉදිරිපත් කර ණයට අදාල ලිපිලේඛණ ඔහු ලවා අත්සන් කොට දිව්රුම් කොමසාරිස්වරයෙකු හෝ සමාදාන විනිශ්චයකරුවකු සහතික කල දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරිමට එකඟ වෙමි.**

**හවුල් ණයකරුගේ අත්සන**.....................................................

**හවුල් ණයකරුගේ නම හා ජා:හැ:අ ........................................................**

**හවුල් ණයකරුට ඇති ඥාතිත්වය ...................................** ...................................................

ප්‍රධාන ණයකරුගේ අත්සන

දිනය - **....................................** දිනය - **....................................**

අනුබද්ධිත සංගමයේ නිර්දේශය

(අනවශ්‍ය වචන කපා හරින්න)

**21.** ..............................................................................................................................නැමති අය අප සංගමයේ පූර්ව සාමාජිකයෙකු වන අතර ඔහුගේ/ඇයගේ සාමාජික අංකය ............................ වේ. ඔහු/ඇය විසින් ඉල්ලුම් කර ඇති රු.................................................................................................. (රු...................) ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය-.................................................. ........................................

**සභාපති/ලේකම්ගේ අත්සන**

**සභාපතිගේ/ලේකම්ගේ නම**....................................

**සංගමයේ නිළ මුද්‍රාව**

---

**සාමාජික සුභසාධක ණය අරමුදලේ ප්‍රයෝජනය සඳහා**

22. ....................................................................... **සංගමයේ සාමාජික අංක**.......................... **දරණ** ............................................................................................................................**නැමති සාමාජිකයා විසින් ඉදිරිපත්** **කර ඇති තොරතුරු නිවැරදිය/වැරදිය.**

23. **එකී සාමාජිකයා විසින් මෙම අරමුදලින් මීට පෙර ලබාගෙන ඇති ණය ගෙවා** ඇති/නැති බව

.....................................................................................................................................

**24.** **සාමාජිකයාගේ විශ්‍රාම වැටුප රු. ........................ කි. එහි 60% ප්‍රතිශතය රු. ......................... කි**

**අනුමත කල හැකි ණය මුදල** ................................. **පොලිය** ............................... **වාරිකය** .....................................

**සකස් කලේ (අත්සන)** ...................................... **පරික්ෂා කලේ (අත්සන)**..................................................

**නම**....................................................... **නම**.......................................................

---

**සාමාජික සුභසාධක ණය අරමුදල් අනු කමිටුවේ නිර්දේශය**

**25.** ...................................................................................... **සංගමයේ සාමාජික අංක** ................**දරණ** ...................................................................................................**නැමති සාමාජිකයා විසින් ඉදිරිපත් කර ඇති විස්තර** **අනුව** රුපියල්............................................................................ (රු........................) **ණය මුදලක් වර්ෂයකට සියයට** ...................... **බැගින් වූ පොලී ප්‍රතිශතයක් යටතේ නිකුත් කිරීම අනුමත කරනු /නොකරනු ලැබේ.**

26. **ණය ඉල්ලුම් පත්‍රය නිර්දේශ කිරීමට/නොකිරීමට හේතු** .......................................................................

දිනය ...................................... ..............................

**සභාපතිගේ අත්සන හා නම**

**සාමාජික සුභසාධන ණය අනු කමිටුව**

---

**කළමණාකරණ කමිටු අනුමැතිය**

27. **ණයකරු විසින් ඉල්ලුම්කර ඇති රු**..........................................................(රු.....................) **ණය මුදල රු** .......................................................................(රු..........................) **ක් බැගින් වූ වාරික**.............. **කින් අයකර ගැනීමට** **යටත්ව අනුමත කරමි/නොකරමි**

| .............................. | ........................... | ............................. |
|---|---|---|
| **සභාපති** | **ගරු මහලේකම්** | **ගරු භාණ්ඩාගාරික** |
| දිනය :-..................... | දිනය :-..................... | දිනය :-..................... |

## ඇපකරුගේ දිවුරුම් ප්‍රකාශය

.......................................................................දරන ස්ථානයේ පදිංචි ..................................................... ...................................... වන මම පහත සඳහන් ප්‍රකාශය සත්‍ය ලෙසත්, අවංක ලෙසත් ගාම්භිරතා පූර්වකව ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.

1 වන ඇපකරු

1. මුලකුරු සමග නම....................................................................................................................

2. සම්පූර්ණ නම ........................................................................................................................

3. ලිපිනය...................................................................................................................................

4. උපන් දිනය .................. 4 (අ)ණය ඉල්ලුම් කරන දිනට වයස-අවුරුදු ........... මාස-...............දින-........

5. දුරකථන අංක (අ). ස්ථාවර................................ (ආ)ජංගම ...............................................

6. දැනට කරන රැකියාව ............................................................................................................

6 (අ) ලැබෙන වැටුප ..................................................................................................................

7. සාමාජික අංකය........................... 7 (අ). අනුබද්ධිත සංගමය................................................

8. ජාතික හැඳුනුම්පත් අංකය........................... ශ්‍රීලසහප්‍රස හැඳුනුම්පත් අංකය..............................

(පිටපත් ඇමිණිය යුතුය)

9. විශ්‍රාම වැටුප්ලාභී අයෙක්ද ................................. විශ්‍රාම වැටුප් අංකය...............................................

(විශ්‍රාම හැඳුනුම්පතෙහි පිටපතක් ඇමිණිය යුතුය)

10. මාසික ආදායම...........................................................................................................................

12. ඇපකරුවන් වශයෙන් වෙනත් ණය සඳහා අත්සන් කර ඇත්නම් ඒ පිළිබඳ

.......................................................................................................................................

13. ණයකරුගේ නම.........................................................................................................................

14. (අ)සාමාජික අංකය........................... (ආ) අනුබද්ධිත සංගමය.......................................................

15. ජාතික හැඳුනුම්පත් අංකය.................................... ශ්‍රීලසහප්‍රස හැඳුනුම්පත් අංකය.............................

16. ලබාගන්නා ණය මුදල......................................................................................................................

17. ඉහත සඳහන් විස්තර නිවැරදි හා සත්‍ය බවත් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයේ 2026 ජුනි මස 16 දින නිකුත් කරන ලද අංක ශ්‍රීලසහප්‍රස/සුසාණය/2026 දරණ ලිපියට අනුව අනුව ඉහත සඳහන් ණයකරු විසින් ලබාගන්නා ලද ණය මුදලින් 25% හා ඊට නියමිත පොලිය මෙම ණයකරුගේ හදිසි මරණයකදී හෝ සදාකාලික අබාධිත තත්වයකදී ගෙවීමට නොහැකි වන අවස්ථාවක ණයකරු වෙනුවෙන් මාගේ විශ්‍රාම වැටුපෙන් ගෙවීමට මම එකඟ වෙමි.

ඉහත සඳහන් ප්‍රතිඥා ප්‍රකාශය කියවා තේරුම් කර දීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන සහතික කර ප්‍රතිඥාදී වර්ෂ 20.... ක්වූ .................... මස ........ දින මා ඉදිරිපිටදී අත්සන් තබන ලදි.

රු.50 මුද්දරයක් අලවන්න

දිනය-.....................................................

.........................................

1 වන ඇපකරුගේ අත්සන

නම........................................................

ජාතික හැඳුනුම්පත් අංකය..............................

<u>දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකරුගේ සහතිකය</u>

**ඉහත දිවුරුම් ප්‍රකාශය අනුව .............................................................................................. වන ණයකරු ගත් ණය මුදල වාරික 60කින් ගෙවන බවත් ඔහුගේ කලාත්‍රයා මෙම ණය මුදල ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයට ගෙවීමට දැනුවත් බවත්, ණයකරුගේ හදිසි වියෝව/ සදාකාලික අබාධිත තත්වයකදී ණය මුදල ආපසු ගෙවීමේ වගකීම දරන බවත්, මා ඉදිරියේදී අත්සන් කර කැමැත්ත ප්‍රකාශ කල බවට සහතික කරමි.**

**දිවිරුම් කොමසාරිස් / සාමදාන විනිශ්චයකාර (මුද්‍රව තබා අත්සන් කරන්න)**

**අත්සන:-.................................................**

**නම:- ......................................................**

**දිනය:-....................................................**

<u>ඇපකරුගේ දිවුරුම් ප්‍රකාශය</u>

**..........................................................................දරන ස්ථානයේ පදිංචි ..................................................**

**.................................... වන මම පහත සඳහන් ප්‍රකාශය සත්‍ය ලෙසත්, අවංක ලෙසත් ගාම්භිරතා පූර්වකව ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.**

<u>2 වන ඇපකරු</u>

1. **මුලකුරු සමග නම**..................................................................................................................

2. **සම්පූර්ණ නම** ..........................................**2**....................................................................

3. **ලිපිනය**.....................................................................................................................................

4. **උපන් දිනය** .................. 4 (අ)**ණය ඉල්ලුම් කරන දිනට වයස-අවුරුදු** .......... **මාස**-...............**දින**-........

5. **දුරකථන අංක** (අ). **ස්ථාවර**................................ (ආ)**ජංගම** ....................................................

6. **දැනට කරන රැකියාව** .................................................................................................................

   6 (අ) **ලැබෙන වැටුප** .................................................................................................................

7. **සාමාජික අංකය**........................... 7 (අ). **අනුබද්ධිත සංගමය**................................................

8. **ජාතික හැඳුනුම්පත් අංකය**........................... **ශ්‍රීලසහප්‍රස හැඳුනුම්පත් අංකය**.....................................

   **(පිටපත් ඇමිණිය යුතුය)**

9. **විශ්‍රාම වැටුප්ලාභි අයෙක්ද** ................................. **විශ්‍රාම වැටුප් අංකය**.................................................

   **(විශ්‍රාම හැඳුනුම්පතෙහි පිටපතක් ඇමිණිය යුතුය)**

10. **මාසික ආදායම**..........................................................................................................................

12. **ඇපකරුවන් වශයෙන් වෙනත් ණය සඳහා අත්සන් කර ඇත්නම් ඒ පිලිබද**

    ...................................................................................................................................................

13. **ණයකරුගේ නම**..........................................................................................................................

14. (අ)**සාමාජික අංකය**........................... (ආ) **අනුබද්ධිත සංගමය**..................................................

15. **ජාතික හැඳුනුම්පත් අංකය**...................................... **ශ්‍රීලසහප්‍රස හැඳුනුම්පත් අංකය**.....................................

16. **ලබාගන්නා ණය මුදල**......................................................................................................................

17. **ඉහත සඳහන් විස්තර නිවැරදි හා සත්‍ය බවත්** ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ **සංගමයේ** 2026 **ජුනි මස 16 දින නිකුත් කරන ලද අංක ශ්‍රීලසහප්‍රස/සුසාණය/2026 දරණ ලිපියට අනුව අනුව ඉහත සඳහන් ණයකරු විසින් ලබාගන්නා ලද ණය මුදලින් 25% හා ඊට නියමිත පොලිය මෙම ණයකරුගේ හදිසි මරණයකදී හෝ සදාකාලික අබාධිත තත්වයකදී ගෙවීමට නොහැකි වන අවස්ථාවක ණයකරු වෙනුවෙන් මාගේ විශ්‍රාම වැටුපෙන් ගෙවීමට මම එකඟ වෙමි.**

**ඉහත සඳහන් ප්‍රතිඥා ප්‍රකාශය කියවා තේරුම් කර දීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන සහතික කර ප්‍රතිඥාදී වර්ෂ 20.... ක්වූ ..................... මස ........ දින මා ඉදිරිපිටදී අත්සන් තබන ලදි.**

රු.50 මුද්දරයක්
අලවන්න

**දිනය**-....................................................

.........................................
**2 වන ඇපකරුගේ අත්සන**

**නම**........................................................

**ජාතික හැඳුනුම්පත් අංකය**..............................

## <u>දිව්රුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකරුගේ සහතිකය</u>

**ඉහත දිවුරුම් ප්‍රකාශය අනුව ........................................................................................................ වන ණයකරු ගත් ණය මුදල වාරික 60කින් ගෙවන බවත් ඔහුගේ කලාත්‍රයා මෙම ණය මුදල ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයට ගෙවීමට දැනුවත් බවත්, ණයකරුගේ හදිසි වියෝව/ සදාකාලික අබාධිත තත්වයකදී ණය මුදල ආපසු ගෙවීමේ වගකීම දරන බවත්, මා ඉදිරියේදී අත්සන් කර කැමැත්ත ප්‍රකාශ කල බවට සහතික කරමි.**

**දිව්රුම් කොමසාරිස් / සාමදාන විනිශ්චයකාර (මුද්‍රව තබා අත්සන් කරන්න)**

**අත්සන:-............................................**

**නම:- .......................................................**

**දිනය:-.....................................................**

**...........................................................................දරන ස්ථානයේ පදිංචි ..................................................**

**.................................... වන මම පහත සඳහන් ප්‍රකාශය සත්‍ය ලෙසත්, අවංක ලෙසත් ගාම්බිරතා පූර්වකව ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.**

විශ්‍රාම වැටුප් අධ්‍යකෂ ජෙනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.                                        202............... මස.................දින

මහත්මයාණෙනි,

**<u>ණය වාරික මුදල් විශ්‍රාම වැටුපෙන් අඩු කිරිමට මනාපය ප්‍රකාශ කිරිම</u>**
**<u>ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීනයන්ගේ සංගමය- සාමාජික සුභසාධක ණය අරමුදල</u>**

මෙම අනුබද්ධිත ........................................................................................ සංගමයේ සාමාජික අංක .................. යටතේ පහත නම හා විස්තර සඳහන් මා විසින් එම සංගමයෙන් ලබාගෙන ඇති ණය මුදල පිටවීම සඳහා දක්වා ඇති පරිදි වාරික මුදල් අඩු කොට ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය විසින් පවත්වාගෙන යනු ලබන **ලංකා බැංකුව නගර ශාඛාව, කොළඹ කොටුව අංක 79164566 දරන "ශ්‍රීලසහප්‍රස සාමාජික සුභසාධක ණය අරමුදල" ගිණුමට බැර කිරිම සඳහා මෙයින් මාගේ එකඟත්වය පළකර සිටිමි. තවද ශ්‍රීලසහප්‍රස අනුමැතියක් නොමතිව මාගේ විශ්‍රාම වැටුපෙන් අඩු කරන මුදල් ණය ගෙවීම නිම වනතෙක් කිසිදු ආකාරයකින් ප්‍රකාශ කල කැමැත්ත අවලංගු නොකරන බව ප්‍රකාශ කරමි.**

**1. සම්පූරණ නම:-.......................................................................................................**

**2. ලිපිනය:-.......................................................................................**

**3. විශ්‍රාම වැටුප් අංකය :-..........................................................(පිටපතක් ඇමිණිය යුතුය)**

**4. ජාතික හැඳුණුම්පත් අංකය :-....................................................... (පිටපතක් ඇමිණිය යුතුය)**

**5. මාසික වාරිකය**
**(1) රු. ..........................(රුපියල්.........................................................)**
**වාරික ගණන ................(....................... සිට .........................දක්වා)**
**(2) රු. ..........................(රුපියල්.........................................................)**
**වාරික ගණන ................(....................... සිට .........................දක්වා)**

**6. විශ්‍රාම වැටුප් ලබා ගන්නා බැංකුව / තැපැල් කාර්යාලය:-.............................................................**

**7. උපන් දිනය:-................................ 8. විශ්‍රාම ගිය දිනය:- .......................................**

**ඉහත සඳහන් ප්‍රතිඥා ප්‍රකාශය කියවා තේරුම් කර දීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන සහතික කර ප්‍රතිඥාදී වර්ෂ 20.... ක්වූ .................... මස ........ දින මා ඉදිරිපිටදී අත්සන් තබන ලදි.**

මෙයට
විශ්වාසී,

| රු.50 මුද්දරයක් අලවන්න |
|---|

...............................................
අයදුම්කරුගේ අත්සන

# දිවුරුම් ප්‍රකාශය

## පහසු ගෙවීමේ පදනම මත මුදල් හා භාණ්ඩ මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබාදීම

## සාමාජික සුභ සාධක ණය අරමුදල - ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමය

1. සාමාජිකයාගේ නම.......................................................................................................................

2. ලිපිනය.......................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය -............................................ 3 (අ) නිකුත් කල දිනය -...............................

4. (අ)සාමාජික අංකය................................... (ආ). අනුබද්ධිත සංගමය....................................

5. ඉහත සඳහන් අනුබද්ධිත සංගමයේ ලියා පදිංචි මා සාමදාන විනිශ්චයකාර තැන ඉදිරියේ සත්‍ය ලෙසත්, ගෞරව පූර්වකවත් ප්‍රකාශ කර සිටිනුයේ මෙසේය

5.1 මෙහි පහත අත්සන් කරන..........................................................................................................

යන ලිපිනයෙහි පදිංචි ......................................................................................................................

වන මම ඉහත සඳහන් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයේ සුභසාධක ණය අරමුදල 2026 ජුනි මස 16 දින නිකුත් කරන ලද අංක ශ්‍රීලසහප්‍රස/සුසාණය/2026 දරණ ලිපිය යටතේ පනවන ලද කොන්දේසි වලට හා පරිපාලන නියෝගවලට යටත්ව 202.............................. දින සිට වර්ෂයකට ............% බැගින් වූ පොලී ප්‍රතිශතයක් හෝ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයේ සාමාජික සුභසාධක ණය අරමුදල විසින් කාලීනව තීරණය කරනු ලබන පොලී ප්‍රතිශතයක් යටතේ ලබාගනු ලබන රුපියල්.................................................................................................. (රු................................)ක ණය මුදල හා ඊට ගෙවිය යුතු පොලියද සමග මුල් මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීම, එම මුදල ලබාගත් දින සිට මාස .......................... ක් ඇතුලතදී සිදුකරන බවට ඉහත කී සංගමයේ සාමාජික සුභසාධක ණය අරමුදල සමග මෙයින් පොරොන්දු වී බැඳී සිටිමි.

තවද මෙකී මුදලේ මුල් වාරිකය ලබාගන්නා ලද දින සිට අවසාන වාරිකය ගෙවනු ලබන............................ දිනය දක්වා වූ කාලය ඇතුලත එම ණය හා ඊට අදාල වර්ෂයකට ...........% බැගින් වූ පොලිය මාස්පතා සෑම මසකම ........................දින හෝ ඊට පෙරද ඉන්පසුව ගෙවීමට ඇති ණය මුදල ගෙවා නිම කරන දින දක්වා ඊට අයත් වර්ෂයකට.................% පොලිය හා ණය මුදලින් මසකට රුපියල්..........................................(රු.........................) බැගින් වර්ෂ 202..... ක් වූ ............................ මස ................ දිනට හෝ ඊට පෙර මාසික වාරික වශයෙන් වාරික ..................... කින් ගෙවීමටත් ඉහත සංගමයේ සුභසාධක ණය අරමුදල 2026 ජුනි මස 16 දින නිකුත් කරන ලද අංක ශ්‍රීලසහප්‍රස/සුසාණය/2026 දරණ ලිපිය අනුව හා ඉන්පසුව පනවනු ලබන හෝ පැනවිය හැකි නීති රීති වලට යටත්ව එකී සංගමයට මම මෙයින් පොරොන්දු වෙමි.

**5.2** ඉහත සඳහන් සියළුම කරුණු මාගේ හොඳම දැනුම සහ විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවට මෙයින් ගෞරව පූර්වකව ප්‍රකාශ කර දිවුරා සිටිමි.

1. **සාක්ෂිකරුගේ අත්සන:- .............................. නම:-.............................. ජා:හැ:අ:...........................**

2. **සාක්ෂිකරුගේ අත්සන:- .............................. නම:-.............................. ජා:හැ:අ:...........................**

| |
|---|
| රු.50 මුද්දරයක් අලවන්න |

දිනය-..................................................... .........................................

ණය අයදුම්කරුගේ අත්සන

## <u>කාලත්‍රයාගේ ප්‍රකාශය</u>

6. මෙහි පහත අත්සන් කරන............................................................................................................................................

යන ලිපිනයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක................................ දරණ........................................................................................ . . . .

.................................වන මම, මාගේ ස්වාමි පුරුෂයා /බිරිඳ වන/ මාගේ ...........................................................................................................

අය විසින් ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමයේ සාමාජික සුභසාධක ණය අරමුදලින් ඉල්ලුම්කර ඇති ....................................................ණය මුදල පිළිබඳ මා එම ණය මුදලට හවුල් ණයකරු ලෙස සම්බන්ධවීමට මාගේ පූර්ණ අනුමැතිය ලබා දෙන බවත්, ණයකරුගේ හදිසි අභාවයකදී/ සදාකාලික අභාධිත තත්වයකදී ණය මුදල හා ඊට අදාල පොලි මුදල ගෙවීමේ වගකීම මම දරණ බවටද සහතික වෙමි.

රු.50 මුද්දරයක් අලවන්න

දිනය ...................................

.........................................................

කාලත්‍රයාගේ අත්සන සහ ජා:හැ:අ:
(ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඇමිනිය යුතුය)

## <u>දිවිරුම් කොමසාරිස්/සාමදාන විනිශ්වයකරුගේ සහතිකය</u>

**ඉහත දිවුරුම් ප්‍රකාශය අනුව ......................................................................................... වන ණයකරු ගත් ණය මුදල වාරික 60කින් ගෙවන බවත් ඔහුගේ කලාත්‍රයා මෙම ණය මුදල ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සංගමයට ගෙවීමට දැනුවත් බවත්, ණයකරුගේ හදිසි වියෝව/ සදාකාලික අබාධිත තත්වයකදී ණය මුදල ආපසු ගෙවීමේ වගකීම දරන බවත්, මා ඉදිරියේදී අත්සන් කර කැමැත්ත ප්‍රකාශ කල බවට සහතික කරමි.**

**දිවිරුම් කොමසාරිස් / සාමදාන විනිශ්වයකාර (මුද්‍රව තබා අත්සන් කරන්න)**

**අත්සන:-............................................**

**නම:- ......................................................**

**දිනය:-....................................................**